ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT


මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/4/3

2019 නොවැම්බර් මස 21 වන දින

**සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් / සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්/**
**සියලුම ආණ්ඩුකාර ලේකම්වරුන් වෙත**

**විදේශ සංචාර තාවකාලිකව අත්හිටුවීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ සමාංක හා 2019.11.19 දිනැති ලිපිය හා බැඳේ.

ඒ අනුව, පෞද්ගලික විදේශ නිවාඩු සහ නිසි ක්‍රමවේදයන් යටතේ තෝරා ගන්නා ලද පශ්චාත් උපාධි සහ ආචාර්ය උපාධි සඳහා විදේශගත වන නිලධාරීන් සම්බන්ධයෙන් උක්ත චක්‍රලේඛයේ කොන්දේසි අදාළ නොවන බව කාරුණිකව දන්වා සිටිමි.

කෙසේ වෙතත්, මෙම විදේශ නිවාඩු අනුමත කරනු ලබන නිලධාරියා ඉහත බැහැරවීම් සාධාරනීකරණය සඳහා ඉදිරිපත් කරන හේතු සම්බන්ධයෙන් සෑහීමකට පත්විය යුතු බව අවධාරණය කරමි.

එසේම, විදේශයන්හි පවත්වන වැඩසටහන් සඳහා රට නියෝජනය කරමින් අනිවාර්යයෙන් සහභාගි විය යුතු අවස්ථාවලදී අදාළ නිවාඩු අනුමත කිරීමේ බලධාරියා ගේ විශේෂ නිර්දේශයක් සහ අවශ්‍යතාවය තහවුරු කිරීම සඳහා වන ලේඛණ ද සහිතව එම ඉල්ලීම මෙම කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය.

පී.බී. ජයසුන්දර
ජනාධිපති ලේකම්

පිටපත් :
1. අග්‍රාමාත්‍ය ලේකම්
2. අමාත්‍ය මණ්ඩල ලේකම්
3. විගණකාධිපති


ගාලු මුවදොර, කොළඹ 01 | දුරකථන ++ 94 (0) 11 2354418 | ෆැක්ස් ++ 94 11 2446657 | ඉ-තැපෑල prsec@presidentsoffice.lk